**සැ. යු. -** 2025.09.19 වැනි දින පළ කරන ලද අංක 2455 *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,455 - 2025 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.09.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1128 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1134 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1143 |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ඔක්තෝබර් 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජුනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## කොත්මලේ ප්‍රාදේශීය සභාව

කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සංගිලිපාලම ජල ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය තනතුරු සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවකයින් බඳවා ගැනීම

කොත්මලේ ප්‍රාදේශීය සභාවේ පහත විස්තර සඳහන් ප්‍රාථමික සේවයේ ශිල්පීය නොවන සහ අර්ධ ශිල්පීය ගණයේ තනතුරු සඳහා දෛනික පදනමින් සේවයට යොදවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 03කට වැඩි කාලයක් ස්ථිර පදිංචියක් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *සේවක ගණය* | *බඳවා ගන්නා ශ්‍රේණිය* | *බඳවා ගන්නා පදනම* | *බඳවා ගන්නා සංඛ්‍යාව* | *දෛනික වැටුප් ගෙවීමේ පදනම* |
|---|---|---|---|---|---|
| ස්ථාන භාර නිලධාරී (ජල ප්‍රදේශ භාර පරිපාලක) | අර්ධ ශිල්පීය | III | දෛනික පදනම මත | 01 | රා.ප.ච. 10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| පද්ධති ක්‍රියාකරු (ජල පොම්ප ක්‍රියාකරු) | අර්ධ ශිල්පීය | III | දෛනික පදනම මත | 02 | රා.ප.ච. 10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| පුහුණු ශ්‍රමික (වැද්දුම්කරු) (ජල පිරිපහදු බලාගාර/ පයිප්ප තැබීම) | අර්ධ ශිල්පීය | III | දෛනික පදනම මත | 02 | රා.ප.ච. 10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| පුහුණු ශ්‍රමික (ජලනල කාර්මික) (ජල බෙදාහැරීමේ සම්ප්‍රේෂණ පද්ධති සඳහා) | අර්ධ ශිල්පීය | III | දෛනික පදනම මත | 01 | රා.ප.ච. 10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| නුපුහුණු කම්කරු (සහය බලාගාර ක්‍රියාකරු) | ශිල්පීය නොවන | III | දෛනික පදනම මත | 01 | රා.ප.ච. 10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| නුපුහුණු කම්කරු (ජල මනු කියවන්නා) (ස්ථානාධිපති සහායක) | ශිල්පීය නොවන | III | දෛනික පදනම මත | 02 | රා.ප.ච. 10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |
| පුහුණු කම්කරු (ජල වැඩ කම්කරු) (නිවාස සම්බන්ධතා) | ශිල්පීය නොවන | III | දෛනික පදනම මත | 01 | රා.ප.ච. 10/2025 පරිදි දෛනික වැටුපක් සහ අදාළ දීමනා ගෙවනු ලැබේ. |

**ස්ථාන භාර නිලධාරි තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්:-**

i. **අධ්‍යාපන සුදුසුකම්** .- අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එකවර සමත් වීම.

අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී තෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර ගණිතය හෝ විද්‍යා විෂය ධාරාවෙන් රසායන විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව සමත් විය යුතුය.

ii. **ශිල්පීය නිපුණතා** .- ජල ව්‍යාපෘති ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්ද හා පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයක ජාතික වෘත්තීය සුදුසුකම් 05 (NVQ V) මට්ටම නොඅඩු ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවක් සපුරා තිබීම.

**පද්ධති ක්‍රියාකරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්:-**

i. *අධ්‍යාපන සුදුසුකම්* - අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එකවර සමත් වීම.

ii. *ශිල්පීය නිපුණතා* - වෘත්තියට අදාළව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලබා ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවන් හි (NVQ 03) මට්ටමේ - ( විදුලි) විෂයය යටතේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

iii. ජලනළ කාර්මික ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම.

**පුහුණු ශ්‍රමික(ජල පිරිපහදු බලාගාර/පයිප්ප තැබීම) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්:-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙන් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම, මින් විෂයයන් 05ක් එක්වරක දී සමත්ව තිබීම සමග ජලනල කාර්මික ශිල්පය හෝ ඊට සමානව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය කුසලතාවයන් හි 3 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**පුහුණු ශ්‍රමික (ජල බෙදාහැරීමේ සම්ප්‍රේෂණ පද්ධති සඳහා) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්:-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙන් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම සමග ජලනළ කාර්මික ශිල්පය හෝ ඊට සමානව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවයන්හි 3 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**නුපුහුණු කම්කරු(සහය බලාගාර ක්‍රියාකරු) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්:-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී එකවර විෂයයන් තුනක් සමත්වීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක්ව සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක්වරක දී සමත්ව තිබීම හෝ ජල මනු කියවීම සම්බන්ධ වෘත්තිය පළපුරුද්ද තිබීම.

**නුපුහුණු කම්කරු(ස්ථානාධිපති සහායක) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්:-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක්ව සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක්වරක දී සමත්ව තිබිය යුතුය.

**පුහුණු කම්කරු(නිවාස සම්බන්ධතා) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්:-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙන් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම සමග ජලනළ කාර්මික ශිල්පය හෝ ඊට සමානව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවයන්හි 3 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**02 බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි:**

i. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

ii. අයදුම්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

iii. අයදුම්කරු මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

v. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු අතර,දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.

vi. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතුය.

vii. මෙම බඳවා ගැනීම සඳහා සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

viii. අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන කාලසීමාව අතරතුර කාලයේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලය කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතු වේ.

ix. මෙය ස්ථිර සේවයේ කිසිදු පත්වීමක් ලැබීම සඳහා හිමිකමක් නොවන අතර, මෙය හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් බඳවා ගැනීමක් පමණි.

**03. බඳවා ගැනීමේ ක්‍රමය:**

**i. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් බඳවා ගැනේ.**

(අ) අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ.

**අර්ධ ශිල්පීය තනතුරු සඳහා:**

(ස්ථාන භාර නිලධාරි (ජල ප්‍රදේශභාර පරිපාලක)/ පද්ධති ක්‍රියාකරු(ජල පොම්ප ක්‍රියාකරු),
පුහුණු ශ්‍රමික (වැද්දුම්කරු- ජල පිරිපහදු බලාගාර/පයිප්ප තැබීම),
පුහුණු ශ්‍රමික (ජලනල කාර්මික- ජල බෙදාහැරීමේ සම්ප්‍රේෂණ පද්ධති සඳහා):

| *පරික්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 50 | උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරාගනු ලැබේ. |
| තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රශ්න කිරීම | 40 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 10 | |
| මුළු ලකුණු | 100 | |

**ශිල්පීය නොවන තනතුරු සඳහා:**

(නුපුහුණු කම්කරු(සහය බලාගාර ක්‍රියාකරු)/ නුපුහුණු කම්කරු (ජල මනු කියවන්නා - ස්ථානාධිපති සහායක)/පුහුණු කම්කරු (ජල වැඩ කම්කරු-නිවාස සම්බන්ධතා):

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය 100* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

**04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

i. දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගන්නා සේවකයින්ට රා.ප.ච.10/2025 උපදෙස් පරිදි වැඩකරන දින ගණන අනුව දෛනික වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

ii. දැනටමත් මෙම ආයතනයේ දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවය කරන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

iii. යම් අයදුම්කරුවෙකු තෝරාගන්නා පරිද්දෙන් කවර අන්දමකින් වුවද අයථා සංග්‍රහ පැතීම හෝ එහිලා බලපෑමක් කිරීමට තැත් කිරීම එම අයදුම්කරු නුසුදුස්සෙකු කිරීමට හේතු වනු ඇත.

**05.අයදුම්පත් යොමු කළ යුතු ආකාරය:**

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය අනුව ඒ- 4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන ලද අයදුම්පත් **2025.10.16 වැනි දින** හෝ එදිනට පෙර ලැබෙන සේ “ලේකම්” කොත්මලේ ප්‍රාදේශීය සභාව,පුඩළුඔය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ, අපහැදිලි නියමිත දිනට නොලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කරන සහතිකවල මුල් පිටපත් පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුවේ. එයට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කළ හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පරීක්ෂණ අවස්ථාවට ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත  සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලදපිටපත් අමුණා එවිය යුතුයි.

a. උප්පැන්න සහතිකය;
b. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත;
c. අධ්‍යාපන සහතික;
d. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය;
e. පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරී සහතිකය;
f. මෑතක දී ලබා ගත් චරිත සහතික 02ක් (01ක් තමා පදිංචි කොටසේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.

එච්.එම්.ජී.අජිත් පුෂ්පකුමාර
ලේකම්,
කොත්මලේ ප්‍රාදේශීය සභාව

2025 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සංගිලිපාලම ජල ව්‍යාපෘතියේ**

**……………………………………………………………………තනතුර සඳහා අයදුම් පත්‍රය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම:……………………………………………………………………………………
2. මුලකුරු සමග නම:……………………………………………………………………………………………
3. ස්ථිර ලිපිනය :………………………………………………………………………………………………
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :……………………………………………………………………………………
5. උපන් දිනය : වර්ෂය:………………… මාසය:………………… දිනය:…………………
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:………………… මාස:………………… දින:…………

7. ජාතික හැඳුනුම්පත් අංකය :……………………………

8. දුරකථන අංකය :……………………

9. විවාහක/අවිවාහක බව :…………………

10. ස්ත්‍රී/පුරුෂ භාවය :………………………………………

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද/ යන වග:………………………………………

12. රියදුරු බලපත්‍ර අංකය (අදාළ නම් පමණි) :………………………………………

13. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න.)

**අ.පො.ස. (සා. පෙළ) විභාගය :**

පළමුවර - සමත් වර්ෂය :………………… විභාග අංකය :………………

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

දෙවනවර - සමත් වර්ෂය :………………… විභාග අංකය :………………

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

**අ.පො.ස. (උ. පෙළ) විභාගය :**

සමත් වර්ෂය :………………… විභාග අංකය :………………

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |
| 05. | |

14. ඉල්ලුම් කරන තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම් : ……………………………………………………………………
……………………………………………………………………………………………………………

15. වෙනත් සුදුසුකම් :……………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

16. 1. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?:……………………………

2. පිළිතුරු "ඔව්" නම් විස්තර සඳහන් කරන්න :………………………………………………………

17. මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බවට ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බවද දනිමි.

………………………,
අයදුම්කරුගේ අත්සන.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාම ප්‍රධානියෙකු/කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදා අධිකාරිලත් නිලධාරියෙකු/රු. 2,24,260.00ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජකවරයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුයි.

ඉහත අත්සන් කර ඇති ………………………………………………………………………මහතා/මහත්මිය/මෙනවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු මා ඉදිරිපිට දී අත්සන යෙදූ බවත් මෙයින් සහතික කරමි.

…………………………
අත්සන හා නිල මුද්‍රාව.

නම :…………………………………………………
තනතුර :…………………………………………………
ලිපිනය :…………………………………………………
දිනය :…………………………………………………

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරන ……………………………………………………………මහතා/මිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ……………………………………………………………වශයෙන් සේවය කරන අතර, මොහු/මැය කිසියම් විනයානුකූල දඬුවමකට ලක් වී නොමැති බව පෞද්ගලික ලිපි ගොනුව අනුව සහතික කරමි. අයදුම්පත නිර්දේශ කරමි.

…………………………………………………,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :…………………………………………………
පදවි නාමය :…………………………………………………
දෙපාර්තමේන්තුව/ආයතනය :…………………………………………………
දිනය :…………………………………………………

09-239

# පළාත් පාලන නිවේදන

## කැලණිය ප්‍රාදේශීය සභාව

### කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 261 වෙදමුල්ල ග්‍රාම සේවා වසමේ පිහිටි වරාගොඩ අංක 251 වත්ත පාර කැලණිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි 2025 මැයි මස 30 වැනි සිකුරාදා දින පළ වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2439 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ කරන ලද දැන්වීම අනුව දින 30ක කාලයක් ඇතුළත වරාගොඩ අංක 251 වත්ත පාර කැලණිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සම්බන්ධව විරෝධතාවන් ඉදිරිපත් කිරීමක් හෝ නඩු පැවරීමක් සිදු වී නැති නිසා එම මාර්ගය එකී දැන්වීමේ පළ කර ඇති ආකාරයට කැලණිය ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් බවට පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා එකී ප්‍රාදේශීය සභා පනතේ 24(3) වැනි උපවගන්තිය ප්‍රකාරව මෙයින් ප්‍රසිද්ධ කරමි.

ආචාර්ය සඳුන් යාපා කරුණාරත්න,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 12 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය සභාව,
බුළුගහ හන්දිය, කැලණිය.

09-245

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය යටතේ කරනු ලබන විරෝධතා කැඳවීම

යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටිනුවර ප්‍රාදේශීය සභාව තුළ පිහිටියා වූ මංමාවත්/පාරවල් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වූ පියවර අනුගමනය කිරීම සම්බන්ධයෙන් අවසර දී ඇති කාලයක් වශයෙන් 2025.07.18 දින සිට 2028.07.18 දක්වා කාලය සැලකීමට 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අවසර ලබා දී ඇති හෙයින් ද, ඒ අනුව මෙම පහත උපලේඛනයේ විස්තර කරනු ලබන මංමාවත්/පාරවල් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු සභාව විසින් පවත්වා ගෙන යනු ලබන මාංමාවත්/පාරවල් වශයෙන් සැලකීම සඳහා 2025.08.19 දින පැවති මහා සභා තීරණ අංක 5.4.19 යටතේ යෝජනා සම්මත කර ඇති හෙයින් ඊට විරෝධතා ඇත්තේ නම් ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීම සඳහා මෙයින් නිවේදනය කරමි.

නලින් එරන්ද පිටියේකුඹුර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 31 වැනි දින,
පිළිමතලාව,
ඇඹිල්මීගම,
යටිනුවර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.


| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරී වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග* | *පළල* | *පිඹුරු පත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | ඇටමුරුපිටියේ කෝපිවත්ත මාර්ගය | කොටලිගොඩ | පොත්තපිටිය ප්‍රධාන මාර්ගය | එච්. පී. ලාල් කුමාර රංජිත් මහතාගේ නිවස අසල | 1. ආර්. ජී. පාලිත මයා<br>2. එච්. පී. සුනිල් ආනන්ද මයා<br>3. එච්. පී. සුදත් කිසාන්ත මයා<br>4. එච්. පී. ලාල් කුමාර රංජිත් මයා | 1. ආර්. මනතුංග මයා<br>2. එස් කේ. ඒකනායක මිය<br>3. එස්. පී. මනතුංග මයා | මීටර් 70 | මීටර් 2.43 | 10954 |

K.B.LANSAKARANAYAKE
REGD.LICENSED SURVEYOR
215,PILIMATHALAWA.

PLAN NO:10954

PROPOSE ETAMURUPITIYE KOPIWATTA ROAD
LENGTH = 67 WIDE = 8 FT

SCALE = 1 : 500




SCALE:1 : 500

REFERENCE
ST:STAKE WOODEN

PLAN
OF
AN ALLOTMENT OF LAND CALLED
ETAMURUPITIYE KOPIWATTA(PROPOSE ROAD)
SITUATED AT = ETAMURUPITIYA
G.S. = KOTALIGODA NORTH
IN KANDUPALATHA KORALE OF YATINUWARA
A.G.A. = YATINUWARA
PRADESHIYA SABA = YATINUWARA
KANDY DISTRICT
CENTRAL PROVINCE

| CONTAINING IN EXTENT | | |
|---|---|---|
| LOT NO | A - R - P | (HECT:) |
| 1 | 0 - 0 - 08.48 | (0.0214) |

SURVEYED ON = 30.06.2025

K. B. LANSAKARANAYAKE (T. S. L.)
Registered Licensed Surveyor
(Q: F. All Island)
215, Pilimatalawa

09-228

**අරණායක ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (ආනුශංගික විධිවිධාන පනතේ) 02 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(2) ආ වගන්තිය ප්‍රකාරව 2025 මැයි මස 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV ආ කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද මෙම මාර්ග, අරණායක ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. පී. මංජුල සෙනවිරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2025 සැප්තැම්බර් මස 12 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | විල්පොල බුදවත්ත පටුමග 03 |
| මාර්ගයේ ආරම්භය | - | එම්. ජේ. එම්. සනා මහතාගේ නිවස අසල |
| මාර්ගයේ අවසානය | - | එම්. ජේ. එම්. නිසාම් මහතාගේ නිවස අසල |
| ග්‍රාම නිලධාරි වසම | - | විල්පොල |
| මාර්ගයේ දිග හා පළල | - | දිග මීටර් - 204 පළල අඩි - 08 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| එම්. ජේ. එම්. සනා | දිගනේ කුඹුර |
| එම්. ජේ. එම්. සනා | මුත්තෙට්ටුලන්ද හේන |
| එස්. එස්. සිත්ති හලීමා | මුත්තෙට්ටුලන්ද හේන |
| එම්. ජේ. එම්. සහුර්දීන් | මුත්තෙට්ටුලන්ද හේන |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| එම්. එම්. එම්. ෆයිෂාන් | මුත්තෙට්ටුලන්ද හේන |
| එම්. එස්. එස්. මව්සිමා | මුත්තෙට්ටුලන්ද හේන |
| එම්. සකරියා උම්මු ෂියා | මුත්තෙට්ටුලන්ද හේන |
| එම්. ජේ. එම්. නිලාම් සහ ලුහුර් | මුත්තෙට්ටුලන්ද හේන |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් ගේ 2024.08.19 දින මනින ලද පිඹුරුපත් අංක 1313/2013 දරන පිඹුරුපත අනුව වේ.

මාර්ගයේ නම - මේනම කොලේවත්ත මාර්ගය
මාර්ගයේ ආරම්භය - සමගි මාවත
මාර්ගයේ අවසානය - ඩබ්ලිව්. ආර්. එස්. ජී. බණ්ඩාර යන අයගේ ඉඩම
ග්‍රාම නිලධාරි වසම - දිප්පිටිය
මාර්ගයේ දිග හා පළල - දිග මීටර් -122 පළල අඩි - 10

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| ඩබ්ලිව්. ආර්. එස්. ජී. බණ්ඩාර | මේනම කුඹුර (දැනට ගොඩ ඉඩම) |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| ඩබ්. ආර්.එස්. බී. සමරකෝන් | මේනම කුඹුර |
| එම්. ආර්. ශිරෝමි අරුණකාන්ති | මේනම කුඹුර |
| ඩබ්. ආර්. ගාමිණී සුමිත් බණ්ඩාර | මේනම කුඹුර |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් ගේ 2023.11.26 දින මනින ලද පිඹුරුපත් අංක 1366/2023 දරන පිඹුරුපත අනුව වේ.

---

මාර්ගයේ නම - ගංඉම සිට පට්ටන්ගල ලයනල් මහතාගේ නිවස දක්වා මාර්ගය
මාර්ගයේ ආරම්භය - ගංඉම
මාර්ගයේ අවසානය - ලයනල් මහතාගේ නිවස
ග්‍රාම නිලධාරි වසම - 45ඒ ගැවිලිපිටිය
මාර්ගයේ දිග හා පළල - දිග මීටර් - 62 පළල අඩි -

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| කේ. ජී. ප්‍රේමලතා | ගංඉමවත්ත |
| එල්. රංජනී විජේලතා | පට්ටංගලවත්ත |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| එම්. පී. සී. පුෂ්පකුමාරි | ගංඉමවත්ත |
| එච්. පී. ජයන්ත රුවන් | පට්ටංගලවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත්ගේ 2024.08.24 දින මනින ලද පිඹුරුපත් අංක 1562 දරන පිඹුරුපත අනුව වේ.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | අම්බලකන්ද නාරංගල මේරිලයින් මැද මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | - | මේරිලයින් පාර |
| මාර්ගයේ අවසානය | - | ගංතුන මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | - | නාරංගල |
| මාර්ගයේ දිග හා පළල | - | දිග මීටර් -308 පළල අඩි - 10 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| රජය කනත්ත සඳහා වෙන් කළ භූමිය | – |
| ආර්. රාජා | නාරංගලවත්ත |
| කේ. ප්‍රියදර්ශනි අබේරත්න | නාරංගලවත්ත |
| වී. ටී. නන්දසේන | නාරංගලවත්ත |
| කේ. ප්‍රියදර්ශනී | නාරංගලවත්ත |
| වී. ටී. ආසිරි | නාරංගලවත්ත |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| එච්. ජයවික්‍රම | නාරංගලවත්ත |
| ජී. කේ. කුසුමාවතී | නාරංගලවත්ත |
| පී. කේ. සිරිල් | නාරංගලවත්ත |
| ජී. කේ. චන්ද්‍රාවතී | නාරංගලවත්ත |
| ජී. කේ. මල්ලිකා පුෂ්පලතා | නාරංගලවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් ගේ 2023.11.26 දින මනින ලද පිඹුරුපත් අංක 1365/2023 දරන පිඹුරුපත අනුව වේ.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | වාගොල්ලවත්ත මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | - | අයගම හන්දිය |
| මාර්ගයේ අවසානය | - | අයගම හන්දියේ සිට වාගොල්ලවත්ත හා කාන්ති රාජපක්ෂගේ ඉඩමෙහි කෙළවර දක්වා |
| ග්‍රාම නිලධාරි වසම | - | දෙවනගල |
| මාර්ගයේ දිග හා පළල | - | දිග මීටර් -125 පළල - 2.50m |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| ජී. ඩී. පියසිරි | මල්නැව කුඹුර |
| ජී. ජී. සේනාරත්න | ලිදමුලවත්ත |
| ජී. ඩී. ප්‍රේමාවති | ලිදමුලවත්ත |
| ජී. ඩී. නුවන් | ලිදමුලවත්ත |
| ජී. ජී. කරුණාසේන | ලිදමුලවත්ත |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| ජී. ජී. චන්ද්‍රලතා | හිටිනාවාගොල්ලවත්ත |
| ජී. ඩී. ලීලාවතී | හිටිනාවාගොල්ලවත්ත |
| ආර්. පී. රාජපක්ෂ | වාගොල්ලවත්ත |

බලයලත් මිනින්දෝරු බර්නාඩ් ආර්. රූපසිංහ ගේ 2023.10.02 දින මනින ලද පිඹුරුපත් අංක 63/23 දරන පිඹුරුපත අනුව වේ.

---

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | ගැව්ලිපිටිය උඩුපිටිය හැවැන්දෙනිය මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | - | කේ. පී. ෂෙල්ටන් මහතාගේ නිවසේ සිට |
| මාර්ගයේ අවසානය | - | එම්. ඩී. චන්ද්‍රලතා පොඩිහාමිනේ මහත්මියගේ නිවස දක්වා |
| ග්‍රාම නිලධාරී වසම | - | 45ඒ ගැව්ලිපිටිය ගම |
| මාර්ගයේ දිග හා පළල | - | දිග මීටර් -125 පළල අඩි - 10 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| ආර්. පී. ජේම්ස් | උඩුපිටිය වත්ත |
| එම්. ආරියරත්න | උඩුපිටිය වත්ත |
| ඩී. කේ. නිමල් | උඩුපිටිය වත්ත |
| ආර්. පී. ශ්‍රියානි | උඩුපිටිය වත්ත |
| බී. ඩී. ශාන්ත කුලතුංග | උඩුපිටිය වත්ත |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| අයි. ආර්. සමන් කුමාර | උඩුපිටිය වත්ත |
| ගුණසේකර | උඩුපිටිය වත්ත |
| අජිත් කුමාර | උඩුපිටිය වත්ත |
| එම්. පී. ඉන්දික රුවන් කුමාර | උඩුපිටිය වත්ත |
| එච්. පී. ෂෙල්ටන් | උඩුපිටිය වත්ත |
| ආර්. පී. තිලකරත්න | උඩුපිටිය වත්ත |
| කේ. පී. ලලිත් ෂෙල්ටන් | උඩුපිටිය වත්ත |
| ඊ. පී. සුනිල් එදිරිසිංහ | උඩුපිටිය වත්ත |
| ඩී. ප්‍රේමලතා | උඩුපිටිය වත්ත |
| එම්. ආර්. චන්ද්‍රලතා පොඩිමැණිකේ | උඩුපිටිය වත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් ගේ 2024.06.11 දින මනින ලද පිඹුරුපත් අංක 1488 දරන පිඹුරුපත අනුව වේ.

---

මාර්ගයේ නම - දිගනේ කුඹුර හරහා කොස්පැලවත්ත මාර්ගය
මාර්ගයේ ආරම්භය - දිගනේ කුඹුර
මාර්ගයේ අවසානය - මායිම් කණුව අසලින්
ග්‍රාම නිලධාරී වසම - 17 ඩී, ගම්මන්නාගොඩ
මාර්ගයේ දිග හා පළල - දිග මීටර් - 428 පළල - අඩි 08

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| වයි. ජී. චමිල එරංග පුෂ්පකුමාර | දිගනේ කුඹුර |
| ආර්. බී. පද්මාවතී | දිගනේ කුඹුර |
| ආර්. බී. පද්මාවතී | දිගනේ කුඹුර |
| කේ. ජී. සරෝජා නිශාන්ත | දිගනේ කුඹුර |
| යූ. වී. චාර්ලිස් | දිගනේ කුඹුර |
| පී. වී. විජේසිංහ | දිගනේ කුඹුර |
| වී. ජී. ඇඩ්මන් | දිගනේ කුඹුර |
| පී. වී. විජේසිංහ | දිගනේ කුඹුර |
| යූ. වී. නාලක සෙනවිරත්න | දිගනේ කුඹුර |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| ආර්. බී. පද්මාවතී | දිගනේ කුඹුර |
| ආර්. බී. පද්මාවතී | දිගනේ කුඹුර |
| කේ. ජී. සරෝජා නිශාන්ති | දිගනේ කුඹුර |
| යූ. වී. චාර්ලිස් | දිගනේ කුඹුර |
| වී. ජී. ඇඩ්මන් | දිගනේ කුඹුර |
| පී. වී. විජේසිංහ | දිගනේ කුඹුර |
| යූ. වී. නාලක සෙනවිරත්න | දිගනේ කුඹුර |

බලයලත් මිනින්දෝරු එම්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2024.05.16 දින මනින ලද පිඹුරුපත් අංක 1467 දරන පිඹුරුපත අනුව වේ.

---

මාර්ගයේ නම - මාවතගොඩ පටුමග
මාර්ගයේ ආරම්භය - අරණායක ප්‍රධාන මාර්ගයේ මුල සිට
මාර්ගයේ අවසානය - අතුරු මාර්ගය දක්වා
ග්‍රාම නිලධාරී වසම - 45 ඊ විල්පල
මාර්ගයේ දිග හා පළල - දිග මීටර් -54 16 පළල - අඩි 10 04

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| කේ. ඩී. මෛත්‍රීපාල | මීගහමුලවත්ත |
| එස්. මර්ජානා | මීගහමුලවත්ත |
| ජේ. එෆ්. ෆාසෙලා | මීගහමුලවත්ත |
| එම්. ඉසඩ්. ජේ. නෂීමා | මීගහමුලවත්ත |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| එම්. ඉසඩ් ජේ. නෂීමා | මීගහමුලවත්ත |
| එම්. ඉසඩ්. එම්. හකීම් | මීගහමුලවත්ත |

බලයලත් මිනින්දෝරු එම්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2024.03.14 දින මනින ලද පිඹුරුපත් අංක 1431/2024 දරන පිඹුරුපත අනුව වේ.

මාර්ගයේ නම - පරගහවෙල කොට්වුන්න

මාර්ගයේ ආරම්භය - නාරංගම්මන කටුගහ මාර්ගයේ පරගහවෙල ඇළ අසලින්

මාර්ගයේ අවසානය - අඹදෙණියවත්ත කටුගහ මාර්ගයේ බෝගහ අසලින්

ග්‍රාම නිලධාරී වසම - 45 ඕ නාරංගම්මන

මාර්ගයේ දිග හා පළල - දිග මීටර් - 117 පළල - අඩි 08

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| එච්. පී. රංජිත් කුමාරි | පරගහවෙලවත්ත |
| එම්. බී. රංජිත් සෙනවිරත්න | පරගහවෙලවත්ත |
| යූ. පී. නිමල් ආරියරත්න | දෙල්ගහමුලවත්ත |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| එච්. පී. රංජිත් කුමාරි | පරගහවෙලවත්ත |
| එම්. බී. රංජිත් සෙනවිරත්න | පරගහවෙලවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2024.05.14 දින මනින ලද පිඹුරුපත් අංක 1465 දරන පිඹුරුපත අනුව වේ.

---

මාර්ගයේ නම - දෙල්ගහමුලවත්ත

මාර්ගයේ ආරම්භය - මාවනැල්ල - අරණායක ප්‍රධාන මාර්ගය

මාර්ගයේ අවසානය - මා ඔය

ග්‍රාම නිලධාරී වසම - 45 ඊ - විල්පල

මාර්ගයේ දිග හා පළල - දිග මීටර් - 63 පළල - අඩි 08

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| යූ. ඩබ්. ජී. එන්. ආරියරත්න | දෙල්ගහමුලවත්ත |
| එම්. පී. එස්. එන්. සෙනවිරත්න | දෙල්ගහමුලවත්ත |
| යූ. පී. නිමල් ආරියරත්න | දෙල්ගහමුලවත්ත |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් :*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| එෆ්. එම්. නලීම් | දෙල්ගහමුලවත්ත |
| එස්. එස්. සුහේරා | දෙල්ගහමුලවත්ත |
| ඒ. ඒ. එල්. මැණිකේ | දෙල්ගහමුලවත්ත |
| ඩී. ජී. ඩී. එන්. කරුණාතිලක | දෙල්ගහමුලවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් ගේ 2024.05.22 දින මනින ලද පිඹුරුපත් අංක 1460 දරන පිඹුරුපත අනුව වේ.

09-281

---

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

### නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ අගෝස්තු මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. පී. සාගර විජේසේකර,
සභාපති,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව,

2025 අගෝස්තු මස 12 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධාන වලට අනුකූලවන පරිදි පහත උපලේඛන වල සඳහන්, විගණනය කරනලද නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛන I

2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

උපලේඛන II

2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

උපලේඛන III

2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

උපලේඛන I

**2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 31.12.2024<br>රු. ශත | 31.12.2023<br>රු. ශත |
|---|---|---|---|
| **මෙහෙයුම් අයභාරය** | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 01 | 113,378,896.31 | 101,627,935.67 |
| වෙනත් අයභාර | 02 | 293,720,142.96 | 294,799,847.31 |
| **මුළු මෙහෙයුම් අයභාරය** | | **407,099,039.27** | **396,427,782.98** |
| **මෙහෙයුම් වියදම** | | | |
| පුනරාවර්තන වියදම | 03 | 283,525,809.35 | 230,250,252.02 |
| **මුළු මෙහෙයුම් වියදම** | | **283,525,809.35** | **230,250,252.02** |
| වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය | | 123,573,229.92 | 166,177,530.96 |
| ප්‍රාග්ධන ලැබීම් | 04 | 34,930,955.36 | 13,375,833.41 |
| ප්‍රාග්ධන වියදම් | 05 | 98,417,707.55 | 88,503,306.67 |
| **වර්ෂය සඳහා වන අතිරික්තය/ඌණතාවය** | | **60,086,477.73** | **91,050,057.70** |

උපලේඛන II

**2024 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 31.12.2024<br>රු. ශත | 31.12.2023<br>රු. ශත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 06 | 1,311,774,814.68 | 1,279,756,043.78 |
| ජංගම වත්කම් | | | |
| තොග | 07 | 12,944,315.04 | 12,349,134.42 |
| සේවක ණය | 08 | 24,700,810.56 | 25,109,761.36 |
| ලැබිය යුතු දෑ | 09 | 291,594,345.97 | 255,613,116.26 |
| ආයෝජන | 10 | 630,122,496.18 | 345,416,711.49 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 24,740,830.07 | 8,898,958.79 |
| **මුළු වත්කම්** | | **2,295,877,612.50** | **1,927,143,726.10** |
| **වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | - | - |
| ජංගම වගකීම් | 13 | 139,582,640.13 | 60,093,476.36 |
| හිමිකම් | 14 | 2,156,294,972.37 | 1,867,050,249.74 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **2,295,877,612.50** | **1,927,143,726.10** |

උපලේඛන III

**2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | *31.12.2024*<br>*රු. ශත* | *31.12.2023*<br>*රු. ශත* |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ඌණතාවය | 123,573,229.92 | 166,177,530.96 |
| මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපීම් | - | - |
| ක්ෂය වීම් | - | - |
| පාරිතෝෂික වෙන් කිරීම් | - | - |
| පෙර වර්ෂ සඳහා ගැලපීම් | 197,139,474.00 | (103,189.01) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය** | **320,712,703.92** | **166,074,341.95** |
| තොග/ණයගැතියන්/අනෙකුත් ලැබීම් (වැඩිවීම්) අඩුවීම් | (36,167,459.53) | 36,707,037.09 |
| ණය හිමියන් ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම) | 79,489,163.77 | (14,642,53.66) |
| **01. මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **364,034,408.16** | **188,138,825.38** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| දේපල අත්පත් කර ගැනීම්/ඉවත් කිරීම් | (284,705,784.69) | (120,509,312.99) |
| ප්‍රාග්ධන වියදම් | (98,417,707.55) | (88,503,306.67) |
| 02. ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **(383,123,492.24)** | **(209,012,619.66)** |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| ප්‍රාග්ධන ලැබීම් | 34,930,955.36 | 13,375,833.41 |
| ණය ආපසු ගෙවීම්/ණය ලැබීම් | - | - |
| 03. මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **34,930,955.36** | **13,375,833.41** |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් (1+ 2 +3) | 15,841,871.28 | (7,497,960.87) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | 8,898,958.79 | 16,396,919.66 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ සටහන 'A' | **24,740,830.07** | **8,898,958.79** |
| සටහන A | | |
| ලංකා බැංකුව - ජංගම ගිණුම - 0001662471 | 21,147,842.62 | 6,098,033.55 |
| ලංකා බැංකුව - ඉතිරි කිරීමේ ගිණුම - 73031569 | 3,243,433.09 | 2,424,505.88 |
| මුද්දර ගිණුම | 7,805.00 | 7,670.00 |
| අගරු චෙක් ගිණුම | 341,749,36 | 368,749.36 |
| | **24,740,830.07** | **8,898,958.79** |

09-280

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.